# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,133 - 2019 ජූලි මස 19 වැනි සිකුරාදා - 2019.07.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 1360 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1371 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1375 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1376 |


*සැ. යු.* - (i) මරණ දණ්ඩනය අහෝසි කිරීමේ පනත් කෙටුම්පත 2019 ජූලි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) කාලාවරෝධ (සංශෝධන) පනත් කෙටුම්පත 2019 ජූලි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 අගෝස්තු මස 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජූලි මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු III වන ශ්‍රේණිය | 02 | PL1-2016 රු. 24,250 - 10 x 250 - 10 x 270 - 10 x 300 - 12 x 330 - රු. 36,410 | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත් ව තිබීම |

02. බඳවා ගැනීමේ කොන්දේසි :

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් දකුණු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ).
5. බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරන අතර, එහිදී ලබා ගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.
6. දැනටමත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ දෛනික පදනම යටතේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.
7. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලටද, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටද, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව පනවනු ලැබ ඇති හා වරින් වර පනවනු ලබන නීතිරීති වලටද යටත් විය යුතුය.
8. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
II. වැන්දඹු/පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.
III. බඳවා ගනු ලබන අය වසර 03ක පරිවාස කාලයකට යටත්ය. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.
IV. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය භාෂා ප්‍රවීනතාව ලබා ගත යුතුය.
V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

04. තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| | | | | |
|---|---|---|---|---|
| * | අධ්‍යාපන සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය | = | 30 |
| * | අමතර සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය | = | 10 |
| * | පළපුරුද්ද | උපරිම ලකුණු ප්‍රමාණය | = | 10 |
| * | සභා බල ප්‍රදේශයේ පදිංචිය (වසරකට ලකුණු 5 බැගින්) | උපරිම ලකුණු ප්‍රමාණය | = | 45 |
| * | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | උපරිම ලකුණු ප්‍රමාණය | = | 05 |
| | | එකතුව | | 100 |

(තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය 50%)

05. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුය.

- උප්පැන්න සහතිකය
- ජාතික හැඳුනුම්පත
- අධ්‍යාපන සහතික, ඉහළම අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන සහතික
- තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය
- මෑතකදී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක්
- සේවා පළපුරුද්ද පිළිබඳ සහතික
- වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික

(මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.)

06. අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය :

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත් 2019.08.02 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "සභාපති - බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව බෙලිඅත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලතල බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2019 ක් වූ ජූලි මස 04 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව,
බෙලිඅත්ත.

**ආදර්ශ අයදුම්පත්‍රය**

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

***.................................තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම් පත්‍රය***

01. මුලකුරු සමග නම :————————————.
02. මුලකුරු වලින් හැඳින්වෙන නම :————————————.
03. ස්ථිර ලිපිනය :————————————.
04. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :————————————.
06. උපන් දිනය වර්ෂය :———— මාසය:———— දිනය:————
07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු:———— මාස:———— දින:————
08. විවාහක/අවිවාහක බව :————————————.
09. දුරකථන අංකය :————————————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? යන වග :————————————.
11. ඔබ සාපරාදී වරදක් සම්බන්ධව උසාවියකින් වරදකරුවකු වී තිබේද? :————————————.

12. අධ්‍යාපන සුදුසුකම් :

| අ.පො.ස. (සා.පෙ.) | අ.පො.ස. (උසස් පෙළ) |
|---|---|
| ............................................ | ............................................ |
| ............................................ | ............................................ |
| ............................................ | ............................................ |
| ............................................ | ............................................ |
| ............................................ | |
| ............................................ | |
| ............................................ | |
| ............................................ | |

13. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :—————————————.

14. ඔබ දැනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු නම් :

1. දැනට දරන තනතුර :————————
2. එම තනතුරට පත් වූ දිනය :————————
3. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/ආදේශක/අනියම්/කොන්ත්‍රාත්/දෛනික පදනම මතද යන වග) :————————

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ආයතනයේ ............................................ ලෙස සේවය කරනු ලබන ............................................මයා/මිය/ මෙනවිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු කාර්යාලීය ලිපිලේඛන අනුව නිවැරදි වේ. මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————
ආයතන ප්‍රධානියාගේ අත්සන.
නම :————————
තනතුර :————————

දිනය :————————.

07-761

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### මීගමුව මහා නගර සභාව

මීගමුව මහා නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති ගිනිහට, පුස්තකාල සහායක, රියැදුරු, කාර්යාල කාර්ය සහායක, මුරකරු, සෞඛ්‍ය කම්කරු හා වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු සඳහා විවෘතව බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2019-08-19 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | ශ්‍රේණිය | වැටුප් ක්‍රමය |
|---|---|---|---|---|
| 01 | ගිනිහට | 02 | - | RS1 - 2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 29,540 - 7 x 300 - 27 x 370 - රු. 41,630 වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 29,540/= , 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 02 | පුස්තකාල සහායක | 01 | III | PL1-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 24,250 - 10x250 - 10x270 - 10x300 -12x330 - රු. 36,410 වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 24,250/= , 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 03 | රියැදුරු | 04 | III | PL3-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 25,790 - 10x270 - 10x300 - 10x330 -12x350 - රු. 38,990 වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 25,790, 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 04 | කාර්යාල කාර්ය සහායක | 01 | III | PL1-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 24,250 - 10x250 - 10x270 - 10x300 -12x330 - රු. 36,410/= වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 24,250/= , 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 05 | මුරකරු | 01 | III | |
| 06 | සෞඛ්‍ය කම්කරු | 04 | III | PL1-2016 (රා.ප.ච. 3/2016 අනුව) රු. 24,250 - 10x250 - 10x270 - 10x300 -12x330 - රු. 36,410 වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප් පියවර රු. 24,250, 4 වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. |
| 07 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 01 | III | |

01. ගිනිහට තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :-

සේවා ගණය :- නියාමන සේවා

අධ්‍යාපන සුදුසුකම් :- එකවරකදී සිංහල / දෙමළ භාෂාව හා ගණිතය ඇතුලුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබිය යුතු අතර එම අවස්ථාවේදීම හෝ තවත් එක් අතිරේක අවස්ථාවකදී විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව විෂයයන් ද සමත්ව තිබිය යුතුය.

කායික සුදුසුකම් :-

i. උස සෙ.මී. 162 කට නොඅඩු සහ ජෛව ස්කන්ධ දර්ශකය නියමිත පරිදි තිබිය යුතුය. (ජෛව ස්කන්ධ දර්ශකය 18.5 සිට 24 දක්වා විය යුතුය.)

ii. සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

iii. දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් - උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච රහිත ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතරද, වර්ණ පෙනීමද සාමාන්‍ය විය යුතුය.

iv. කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය. (උදා- පච්ච කොටා තිබීම වැනි)

වෙනත් සුදුසුකම් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක (03) අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුයි.

iii. අවිවාහක පිරිමි අයෙකු විය යුතුය.

iv. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ අයෙකු බව පොලිස් වාර්තාවකින් සනාථ කල යුතුය.

v. තනතුරට බඳවා ගැනීම සඳහා නියම කර ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

වයසඃ-

| | | |
|---|---|---|
| අවම සීමාව | - | අවුරුදු 18 ට නොඅඩු |
| උපරිම සීමාව | - | අවුරුදු 24 ට නොවැඩි |

බඳවා ගැනීමේ ක්‍රමය :-

i. ලිඛිත පරීක්ෂණයෙන් හා වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු සඳහා ආධුනික ගිනිභටයින් වශයෙන් තෝරා ගනු ලැබේ.

ii. පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම ආධුනික ගිනිභටයින් කායික, මානසික යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.

iii. පුරප්පාඩු සඳහා තෝරා ගන්නා අයවලුන් එක් අවුරුදු ගිනිභට පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය. පුහුණු කාලසීමාව තුළදී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළඟා නොවන ආධුනික ගිනිභටයින් කිසිම වන්දියක් තොරව පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ.

iv. සාර්ථකව අදාළ පුහුණුව අවසන් කරන ආධුනික ගිනිභටයින් ගිනිභට තනතුර සඳහා ස්ථිරව බඳවා ගනු ලැබේ. පුහුණු කාලසීමාව ස්ථිර සේවා කාලය සඳහා ගණනය කරනු ලබන අතර අදාළ වැටුප් පරිමාණයේ දෙවන පියවරේ තබනු ලැබේ.

v. පුහුණු කාලසීමාව තුළ මාසිකව රු.10,000/- ක දීමනාවක් ගෙවනු ලැබේ.

vi. පුහුණු කාලසීමාව තුළදී කිසිම ආධුනික ගිනිභටයෙකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

vii. පුහුණුවට තෝරා ගන්නා ලද ආධුනික ගිනිභටයින් ස්ථිර තනතුරට පත්කිරීමෙන් අනතුරුව පත් කළ දින සිට වසර 05 ක කාලසීමාවක් අදාළ පළාත් පාලන ආයතනයේ සේවය කරන බවට පත්කිරීම් බලධරයා සමඟ රු.500,000/- ක වටිනාකමකින් යුතු බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කරන අවස්ථාවේදී අත්සන් කළ යුතුය.

viii. ආධුනිකයාගේ අභිමතය පරිදි පුහුණු කාලය තුළ පුහුණුවෙන් ඉවත් වන්නේ නම්, පුහුණුවට වැය වූ සියලුම වියදම් ආයතනය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

ix. ගිනිභට තනතුර සඳහා පත්වීම ලැබූ පත්වීම්ලාභීන් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචි වන ලෙස නියම කළ හැකිය.

ලිඛිත විභාගය :

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *අවම සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය (ජාතික කලාපීය හා ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් ඇති දැනුම, තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම, පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි.) | පැය 01 | 100 | 40 |

*වෘත්තීය පරීක්ෂණය :*

ලිඛිත විභාගයෙන් සමත් අයදුම්කරුවන් සඳහා වන වෘත්තීය පරීක්ෂණය (ප්‍රායෝගික)

මෙම පරීක්ෂණයට සහභාගී වීමේදී ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුවේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| දරා ගැනීමේ හැකියාව<br>i. දිවීම (කිලෝ මීටර් 01 ක දුර දිවීමට ගතවන අවම කාලය අනුව ප්‍රමුඛතාවය)<br>ii. ඩිප්ස් ගැසීම (නිවැරදිව ඩිප්ස් 25 ක් ගැසීමට ගතවන අවම කාලය)<br>iii. බර ඔසවාගෙන යෑම | 60 | 36 |
| සමබරතාවය<br>i. ඉනිමගේ යෑම<br>ii. කඹයෙන් බැසීම | 40 | 24 |

*සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:*

මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ.

*රැකියා විස්තරය:*

i. ගිනි නිවීම් සහ ජීවිත හා දේපළ බේරා ගැනීම සඳහා අවශ්‍ය මෙහෙයුම්, පුහුණුවීම් හා පුහුණු කිරීම්.
ii. ගිලන් රථ සේවා, තාක්ෂණික සේවා, සන්නිවේදන රාජකාරී, ප්‍රභූ ආරක්ෂක සේවා සහ ගිනි නිවාරණ පොරොත්තු රාජකාරී.
iii. හදිසි ආපදා, හදිසි මුදා ගැනීම් සහ විවිධ මානුෂීය අවශ්‍යතාවන් සඳහා වන මෙහෙයුම්.
iv. ගිනි නිවීම් සේවා ස්ථානය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන සියලුම කාර්යයන්.
v. සේවාවේ ඉහල නිලධාරීන් විසින් පවරනු ලබන රාජකාරී කටයුතු යටතට ගැනෙන සියලුම රාජකාරී.
vi. තනතුරට අදාළව නිකුත් කර ඇති දෙපාර්තමේන්තු නියෝග වලට අනුව තම කාර්යයන් ඉටු කිරීම.
vii. ආයතන ප්‍රධාන හෝ දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලබන ඕනෑම රාජකාරියක් ඉටුකිරීම.

02. පුස්තකාල සහායක තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්:-

*සේවා ගණය:-* ප්‍රාථමික ශිල්පීය නොවන

*අධ්‍යාපන සුදුසුකම්:-* අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.)

*සටහන.-* බඳවා ගැනීමේදී අ.පො.ස. (සා.පෙළ) සමතුන් නොමැති විට 8 ශ්‍රේණිය සමතුන්ගෙන් බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

*කායික සුදුසුකම්:-* සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය:- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙකක (02) උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>■ සාමාන්‍ය සාමාර්ථයට ලකුණු - 04<br>■ සම්මාන සාමාර්ථයට ලකුණු - 06<br>■ අධි සම්මාන සාමාර්ථයට ලකුණු - 08<br>■ විශිෂ්ට සම්මානයට ලකුණු - 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |

*සටහන:-* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඉටුකර ගැනීමට අපේක්ෂිත සහතික පරීක්ෂා කිරීමද මෙහිදී සිදු කෙරේ.

වයස:-

අවම සීමාව - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.
උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

රැකියා විස්තරය :- පුස්තකාලය ප්‍රසන්නව, සිත් ඇද ගන්නාසුළු අයුරින් පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු කිරීම, පුවත්පත් සඟරා නියමිත ස්ථානවල තැන්පත් කිරීම, පාඨකයින් විසින් භාරදෙනු ලබන පොත් භාර ගැනීම හා ඒවා නියමිත ස්ථානයේ තැන්පත් කිරීම, පුස්තකාලයාධිපතිට අවශ්‍ය අවස්ථා වලදී සහාය ලබා දීම.

03. රියැදුරු තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :-

සේවා ගණය:- ප්‍රාථමික ශිල්පීය

අධ්‍යාපන සුදුසුකම්:- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (එක් වරකදී විෂයන් පහක් (05) අවම වශයෙන් සමත්ව තිබිය යුතුයි)
*සටහන .-* කසළ ප්‍රවාහනය කරන වාහන වල රියැදුරු තනතුරු සඳහා පමණක් 8 ශ්‍රේණිය සමත් වීම සලකා බලනු ලැබේ.

වෘත්තීය සුදුසුකම් :

1. පෞද්ගලික / කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් 'සී' සහ 'සී1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුයි)

2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුයි.

සංලක්ෂය.- ආයතනයේ අවශ්‍යතාවය අනුව පවතින පුරප්පාඩු බර වාහන පැදවීමේ නිපුණතාව සහිත රියදුරන්ගෙන් පිරවීමට ඇති අවස්ථා වලදී බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොණ්ඩර් 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් එනම්, 'ඒ1' සහ 'සී1' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' සහ ' ඩී1' පන්තියේ බලපත්‍රයක් නැතහොත් තාර බර හොණ්ඩර් 34 ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32 ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිළිබඳ සහතිකයක් හෝ 'ඒ' පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'ඩී' පන්තියේ බලපත්‍රයක්) මූලික සුදුසුකම වශයෙන් නියම කිරීමට පත්වීම් බලධරයා කටයුතු කරනු ඇත.

පළපුරුද්ද: බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතුයි.)

කායික සුදුසුකම්: අවම උස අඩි පහක් (5') විය යුතුය.

දිවාකාලයේ හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුයි. රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මඟින් ඒ බැව් සනාථ කළ යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය: වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟින් සමත් වන අයදුම්කරුවන් පුරප්පාඩු අනුව බඳවා ගනු ලැබේ.

වෘත්තීය පරීක්ෂණය :

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| 2. මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

ඉහත වෘත්තීය පරීක්ෂණය පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන විධායක / මාණ්ඩලික නිලධාරියෙකු, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු හා පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලැබේ.

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

බඳවා ගැනීමේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම් සඳහා පැවැත්වේ. ලකුණු ලබාදීමක් සිදු නොකෙරේ.

වයස:-

අවම සීමාව - අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.
උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

*සටහන* - දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

04. 05. කාර්යාල කාර්ය සහායක හා මුරකරු තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් :-

සේවා ගණය:- ප්‍රාථමික - ශිල්පීය නොවන

අධ්‍යාපන සුදුසුකම්:- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (මින් විෂයන් පහක් (05) එකවර සමත් විය යුතුය.)

*සටහන* :- බඳවා ගැනීමේදී අ.පො.ස. (සා.පෙළ) සමතුන් නොමැති විට 8 ශ්‍රේණිය සමතුන්ගෙන් බඳවා ගැනීමට සලකා බලනු ලැබේ.

කායික සුදුසුකම්:- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය:-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස අ.පො.ස (සා.පෙළ) විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙකක (02) උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ.<br>▪ සාමාන්‍ය සාමාර්ථයට ලකුණු - 04<br>▪ සම්මාන සාමාර්ථයට ලකුණු - 06<br>▪ අධි සම්මාන සාමාර්ථයට ලකුණු - 08<br>▪ විශිෂ්ට සම්මානයට ලකුණු - 10 | 20 | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම) | 05 | |

*සටහන* :- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලබන අවශ්‍යතාද මෙහිදී සලකා බලනු ලැබේ.

වයස:-

අවම සීමාව - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

රැකියා විස්තරය:- ආයතනයන්හි කාර්යයන් ඉටුකිරීම හා ඒවා නිසියාකාරව පවත්වාගෙන යාම සහ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීම සඳහා අවශ්‍ය සහාය ලබාදීම.

06. 07. සෞඛ්‍ය කම්කරු හා වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම්:-

සේවා ගණය:- ප්‍රාථමික - ශිල්පීය නොවන

අධ්‍යාපන සුදුසුකම්:- 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

කායික සුදුසුකම්:- තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමය :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | 50% |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | |
| පෞරුෂත්වය | 05 | |

සටහන:- පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබාගත් අනුපිළිවෙල අනුව පත්වීම් කරනු ලබන අතර, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහි දී සලකා බලනු ලැබේ.

වයසඃ-

අවම සීමාව - අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.
උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

සියලුම තනතුරුවලට අදාළ වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
II. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු බවට සනාථ කළ යුතුය.
III. යහපත් චරිතයකින් යුක්ත වීම.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

තනතුරුවල ස්වභාවය :- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත ය.

භාෂා ප්‍රවීණතාවය :-

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාවය* |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු සේවකයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච. 01/2014 චක්‍රලේඛයේ හා ඊට අනුශාංගික චක්‍රලේඛ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ අනෙකුත් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව (අදාළ වන්නේ නම් පමණි) | අදාළ නොවේ. |

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :-**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, බස්නාහිර පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලටද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි හා නියෝග වලටද, අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝග වලටද, ආයතන ප්‍රධානීන් විසින් නිකුත් කරනු ලබන නියෝග වලටද අනුව කටයුතු කළ යුතුය.

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :-**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වේතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

නාගරික කොමසාරිස් (රා.ඉ.),
මහා නගර සභාව,
මීගමුව.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**තනතුරු සඳහා අයදුම් පත්‍රය**

මීගමුව මහා නගර සභාව

ඉල්ලුම් කරන තනතුර - ......................................................................................................................

1. මුලකුරු සමග නම :- ......................................................................................................
2. සම්පූර්ණ නම :- ......................................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය :- ......................................................................................................
4. ස්ථිර පදිංචි ලිපිනය :- ......................................................................................................
5. දුරකථන අංකය :- ......................................................................................................
6. තැපැල් ලිපිනය :- ......................................................................................................
7. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ......................................................................................................
8. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ..................................................................................
9. ස්ථිර පදිංචිය දරණ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :- ...................................................................
10. උපන් දිනය :- ......................................................................................................
11. 2019-08-19 දිනට වයස :- ......................................................................................................
12. අධ්‍යාපන සුදුසුකම් :- (ඡායා පිටපත් ඇමිණිය යුතුය)
13. පළපුරුද්ද :- (ඡායා පිටපත් ඇමිණිය යුතුය)
14. වෘත්තීය සුදුසුකම් :- (ඡායා පිටපත් ඇමිණිය යුතුය)
15. වෙනත් සුදුසුකම් :-......................................................................................................
16. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කර තිබේද යන වග :-...........................................................

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට, බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත්, යටත් වන බව හොඳාකාරවම දනිමි.

...............................................

අයදුම්කරුගේ අත්සන

දිනය :- .....................................................

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන .....................................................................................මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ................................................................... වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු / ඇය තෝරා පත්වුවහොත් දැනට දරණ තනතුරෙන් නිදහස් කල හැකිය / නොහැකිය. ඔහු / ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි / නොකරමි.

....................................................,

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :-.............................................................................

තනතුර :-.........................................................................

දිනය :-............................................................................

07-831

# පළාත් පාලන නිවේදන

## හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

261 අධිකාරය වූ 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර හඟුරන්කෙත ප්‍රාදේශීය සභව 2019 ජනවාරි මස 29 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 07 යටතේ වූ පහත සඳහන යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දිසානායක මුදියන්සේලාගේ තොටුපලේ ගෙදර රණසිංහ බණ්ඩා,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
හඟුරන්කෙත.

2019 ජුනි මස 25 වැනි දින,
ප්‍රාදේශීය සභාව
හඟුරන්කෙත.

### උපලේඛනය

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) උපලේඛනයේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 අධිකාරය වූ 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 න වගන්තියේ (1) උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2018 සැප්තැම්බර් මස 25 වන දින හා අංක 2,090/4 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ මධ්‍යම පළාතේ ප්‍රදේශීය සභා බල ප්‍රදේශයන්හි ප්‍රජා මණ්ඩල පිහිටුවීම, ලියාපදිංචි කිරීම, ඒවායේ කාර්යය හා කර්තව්‍ය තීරණය කිරීම සහ නියාමනය කිරීම පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාව හඟුරන්කෙත ප්‍රාදේශීය සභා විසින් වැළඳගෙන මෙම යෝජනාව සම්මත වූ බව *ගැසට් පත්‍රයේ* නිවේදනය කරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කළ යුතු යැයි එකී පනතේ 3 වන වගන්තියේ (1) වන වගන්තිය යටතේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

07-569

---

## මොරටුව මහා නගර සභාව

මෙහි පහත උපලේඛනයෙහි සඳහන් අය විසින් එම උපලේඛනයෙහි සඳහන් ස්ථානයේ මස් වෙළඳාම පවත්වාගෙන යාම පිණිස 2019 වර්ෂයට විශේෂ බලපත්‍රය ඉල්ලුම් කර ඇත. ඒ අනුව විශේෂ බලපත්‍ර නිකුත් කිරීම සඳහා මොරටුව මහ නගර සභා සීමාව තුළ පදිංචි යම් අයෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම් *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය ඇති බවත් (272 වැනි අධිකාරය) ගෝඝාතක ආඥාපනතේ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ඒ. තිලකරත්න,
නාගරික කොමසාරිස්,
මොරටුව මහා නගර සභාව.

2019 ජූලි මස 01 වැනි දින,
මොරටුව මහා නගර සභාවේ දී.

| *අනු අංකය* | *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *ව්‍යාපාරය පවත්වාගෙන යන ස්ථානය* | *වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය* | *වෙළඳ ව්‍යාපාරයේ නම* |
|---|---|---|---|---|
| 1 | ඩබ්. සුරේන්ද්‍ර ධර්ශින ප්‍රනාන්දු | මොරටුව විවිධ සේවා සමුපකාරය, මොරටුව. | ශීතකළ කුකුල් මස්, ඌරු මස්,හරක් මස් | ප්‍රනාන්දු ෆාම් ෂොප් ඇන්ඩ් ග්‍රොසරි |
| 2 | සහබ්දීන් මුතුවාපා | 25 A, බණ්ඩාරනායක මාවත, කටුබැද්ද, මොරටුව. | ශීතකළ කුකුල් මස්, හරක් මස්, එළුමස් | ලකී ෆාම් ෂොප් |
| 3 | යූ. මොහොමඩ් ඉහාෆ් | 129/ C, එගොඩඋයන, මොරටුව. | ශීතකල කුකුල් මස් | ඉෆ්රා ෆාම් ෂොප් |
| 4 | එම්. ඒ. ජයන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු | 421 A. (299) ද සොයිසා පාර, මෝල්පේ, මොරටුව. | කුකුල් මස්, ඌරු මස් | එස්. කේ. ෆාම් ෂොප් |
| 5 | මොහොමඩ් සාදුන් | 217/6, පරණ ගාලු පාර, මොරටුව. | ශීතකළ කුකුල් මස්, හරක් මස්, එළුමස් | එස්. එන්. ෆාම් ෂොප් |

07-699

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම් වල හිමිකරුවන් ලෙස අයත් ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළ කරන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය නිවේදනය කිරීම ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(02) වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

02. මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳ යම් විරෝධතාවයක් නොවුණහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. ගාමිණී තෙන්නකෝන්,
සභාපති,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

**ලියාපදිංචි කළයුතු මාර්ග**

| *අනු අංකය* | *ග්‍රාම නිලධාරි වසම* | *මාර්ගයේ නම* | *ආරම්භය* | *අවසානය* | *වම්පස පදිංචිකරුවන්* | *දකුණුපස පදිංචිකරුවන්* | *දිග (මීටර්)* | *පළල (අඩි)* |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | අංක-92 හිද්දවුල බටහිර | හංගිලි ගෙදර වත්ත මාර්ගය | හංගිලි ගෙදර වත්ත මුල සිට | බෝධීන්-වහන්සේ කොටුවවත්තේ කෙළවර | එන්. ජී. ධම්මිකා කුරේ<br>රෝසි පියසේන | එන්. ජී. එස්. ආර්. කුමාර<br>ආර්. එම්. එම්. වී. රූපසිංහ රත්නායක<br>පී. එස්. එස්. ඩබ්. කුමාර | 98 මීටර් | 10 |
| 2 | අංක - 29 කඹුරාදෙණිය | සමගි මාවත | නෙල්ලි ගහමුල කඩේ අසලින් | සොහොන් භූමිය දක්වා | ආර්. එම්. කොයින් මැණිකේ<br>එම්. එම්. අත්තනායක<br>පී. ජී. සේනක ජගත් බණ්ඩාර<br>ඩී. පී. කරුණා රත්න | ඩබ්. එච්. එම්. බාලකුමාරිහාමි<br>ඒ. එම්. බිසෝමැණිකේ<br>ඩී. එම්. එම්. බී. හේරත්<br>ඩී. බී. එම්. ගාමිණී<br>එච්. පී. පුෂ්පවංශ<br>ඩබ්. ඒ. සෙනෙවිරත්න<br>ඩබ්. එච්. එම්. ජයන්ත බණ්ඩාර | 300 මීටර් | 10 |

K.S.M.M.Dissanayake
gistered Licd. Surveyor & Leveller
urt Commissioner
lioya
P.No 072-4606148

PLAN No.1054




## PLAN

of Land called "Samagi Mawatha" Road Portion of
Moragahapela, Udagedarawatta, Galangewatta, Galange Kumbura & Pannaniwatta
Situated at Kamburadeniya Village in Gangapalatha of Udunuwara D.S.Division
KANDY DISTRICT

## CENTRAL PROVINCE

urveyed for Road Development in this area according to Udunuwara
radeshiya Saba Letter No CPC/UNPS/5/4/1 dated 2018.11.19

| Lot No. | Extent | | | | Remarks |
|---|---|---|---|---|---|
| | Hect. | A. | R. | P. | |
| 1 | 0.0500 | 0 | 0 | 19.77 | 8ft–10ft Road width |

undaries pointed out by Mr.D.H.M.B.Herath & Others

Surveyed on 23.12.2018

M.K.S.M.M. Dissanayake
Registered Licensed Surveyor
Court Commissioner
Reg. No. 20041057
2018.12.28

3

19 JUL 2019

P. INDRANI MALLIKA
LICENSED SURVEYOR
Heeyawala
Handessa

PLAN NO 5127/19




Scale 1:1000

## PLAN

## AN ALLOTTMENTS OF LAND CALLED

HANGILIGEDARAWATTA ROAD
SITUATED AT THE HIDDAULA VILLAGE IN
UDUNUWARA MEDAPALATHA
KANDY DISTRICT, CENTRAL PROVINCE.

CONTAINING IN EXTENT

| LOT NO | A. | R. | P | HECTARE | LENGTH | SQ.FT |
|---|---|---|---|---|---|---|
| 1 | 0 | 0 | 11.82 | 0.0299 | 98m | 3214 sq.ft |
| TOTAL | 0 | 0 | 11.82 | 0.0299 | | |

Bounded as described above
SURVEYED ON 10 FEBRUARY 2019

P. INDRANI MALLIKA
LICENSED SURVEYOR

P. INDRANI MALLIKA
Registered Licence Surveyor
2nd Mile Post

07-834

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## රිදීගම ප්‍රාදේශීය සභාව

2018 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය

| | *සටහන්* | *2017.12.31* *රු. ශත* | *2018.12.31* *රු. ශත* |
|---|---|---|---|
| මෙහෙයුම් අයභාරය | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්තන | 1 | 44,111,278.70 | 47,511,774.96 |
| වෙනත් අයභාර | 2 | 36,.447,710.27 | 46,892,405.43 |
| මුළු මෙහෙයුම් අයභාරය | | 80,558,988.97 | 94,404,180.39 |
| මෙහෙයුම් වියදම | | | |
| පුනරාවර්ථන වියදම | 3 | 62,831,510.05 | 73,337,775.09 |
| මුළු මෙහෙයුම වියදම | | 62,831,510.05 | 73,337,775.09 |
| වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය | | 17,727,478.92 | 21,066,405.30 |
| ප්‍රාග්ධන ලැබීම් | 4 | 22,374,279.61 | 26,578,577.69 |
| ප්‍රාග්ධන වියදම් | 5 | 32,696,743.38 | 47,469,458.47 |
| වර්ෂය සඳහා වන අතිරික්තය/ඌණතාවය | | 7,405,015.15 | 175,524.52 |

**2018 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | *සටහන්* | *2017.12.31* *රු. ශත* | *2018.12.31* *රු. ශත* |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 6 | 195,713,155.94 | 210,107,376.29 |
| ජංගම වත්කම් | | | |
| තොග | 7 | 1,042,967.00 | 1,135,583.38 |
| සේවක ණය හා අත්තිකාරම් | 8 | 4,575,419.85 | 5,035,531.14 |
| ලැබිය යුතු දෑ | 9 | 64,910,698.54 | 39,999,821.93 |
| ආයෝජන (පෙර ගෙවුම්) | 10 | 336,145.00 | 519,481.79 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 11 | 21,966,985.18 | 39,940,190.47 |
| මුළු වත්කම් | | 288,545,371.51 | 296,737,985.00 |
| වගකීම් | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 5,513,598.03 | 4,970,302.10 |
| ජංගම වගකීම් | 13 | 43,843,357.84 | 42,789,854.29 |
| හිමිකම් | 14 | 239,188,424.64 | 248,977,828.61 |
| මුළු හිමිකම් සහ වගකීම් | | 288,545,371.51 | 296,737,985.00 |

කේ. විල්බට් කුලතුංග,
සභාපති,
රිදීගම ප්‍රාදේශීය සභාව.

07-513

# විවිධ දැන්වීම්

## 2019 වර්ෂය සඳහා ගැසට් නිවේදනය සංශෝධනය කිරීම

### හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

ඉහත කරුණට අදාළව 2019.06.21 අංක 2,129 දරන *ගැසට් පත්‍රයේ* නිවේදන අංක 06-490/6 හි පළ කරන ලද ප්‍රචාරක දැන්වීම් පිළිබඳ *ගැසට්* නිවේදනයේ යෝජනාව පහත පරිදි සංශෝධනය කරන බව මෙයින් නිවේදනය කරමි.

**2019 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් අයකිරීම**

***යෝජනාව***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221(අ) 122-126 යන වගන්ති යටතේ 1988.08.23 වන දින අංක 520/07 දරන IV(අ) වැනි කොටසේ පළාත් පාලන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති අතුරු ව්‍යවස්ථාව 29 ඡේදය යටතේ හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ප්‍රචාරක දැන්වීම (බැනර් ඇතුළුව) ඉදිකිරීම සහ ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් එක් දැන්වීමකට වර්ග අඩියකට රු. 50.00 ක මුදලක් ද, ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට රු. 65 ක මුදලක් හා ඩිජිටල් දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට රු.60 බැගින් හා විද්‍යුත් ප්‍රචාරක දැන්වීම් පුවරුව සඳහා එක් වර්ග අඩියකට රු 70 බැගින් 2019 වර්ෂයේ පනවා අය කිරීමට හඟුරන්කෙ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නේ ය.

ඉහත කරුණට අදාළව 2019.06.21 අංක 2,129 දරන *ගැසට් පත්‍රයේ* පිටු අංක 1231 හි පළකරන ලද ගොඩනැගිලි පර්යේෂණ ගාස්තු අයකිරීම යෝජනාව පහත පරිදි සංශෝධනය කරන බව මෙයින් නිවේදනය කරමි.

*උපලේඛනය*

| | *රු. ශත* |
|---|---|
| ගෘහස්ථ ගොඩනැගිලි ඉදිකිරීමේ ගාස්තු : | |
| පළමු වර්ග අඩි 100 සඳහා | 300.00 |
| වැඩිවන සෑම එක් වර්ග අඩි 100 ක් හෝ ඉන් කොටස් සඳහා | 100.00 |
| ව්‍යාපාර ගොඩනැගිලි ඉදිකිරීම් : | |
| පළමු වර්ග අඩි 100 සඳහා | 2,500.00 |
| වැඩිවන සෑම එක් වර්ග අඩි 100 ක් හෝ ඉන් කොටසක් සඳහා | 200.00 |

ඩී. එම්. ටී. ජී. රණසිංහ බණ්ඩා,
සභාපති,
හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව.

07-723

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.